2019. 10. 14. දිවයින

# මේ වසරේ ආර්ථික වර්ධනය මන්දගාමී මට්ටමක

## -මහ බැංකුව කියයි

ශ්‍යාම් නුවන් ගනේවත්ත

මේ වසරේ (2019) ආර්ථික වර්ධනය මන්දගාමී මට්ටමක පවතිනු ඇතැයි මහ බැංකුව පවසයි.

## මේ වසරේ...

මේ අනුව සියයට 2.5 ත් සියයට 3 ත් අතර ආර්ථික වර්ධනයක් මේ වසරේදී ලැබෙනු ඇතැයි මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා පවසයි.

පාස්කු ප්‍රහාරයට පෙර මුලින් අපේක්ෂා කළේ මේ වසරේ දී සියයට 4.0 ක ආර්ථික වර්ධනයක් වාර්තා කරනු ඇති බවයි. මේ වසරේ පළමු කාර්තුවේ වාර්තා කළ සියයට 3.7 ක ආර්ථික වර්ධනයට සාපේක්ෂව දෙවැනි කාර්තුවේ ආර්ථික වර්ධනය සියයට 1.6 ක් දක්වා පහත් වැටී ඇත.

මේ වසරේ මන්දගාමී මට්ටමක පවතින ආර්ථිකය මැදි කාලයේදී ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයිද මහ බැංකුව අපේක්ෂා කරයි.

පාස්කු ඉරිදා ප්‍රහාරය නිසා සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වර්ධනයේ සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබුණු බව පවසන මහ බැංකුව පෙන්වා දෙන්නේ මේ අනුව 2019 පළමු කාර්තුවේ සියයට 4.1 ක් වූ සේවා අංශයේ වර්ධනය ද සියයට 1.6 ක් දක්වා පහත වැටුණු බවයි.

එසේම කෘෂි අංශයේ වර්ධනය පළමු කාර්තුවේ පැවති සියයට 3.5 සිට දෙවන කාර්තුවේ දී සියයට 1.0 දක්වා සහ කර්මාන්ත අංශයේ වර්ධනය පළමු කාර්තුවේ පැවති සියයට 3.0 සිට දෙවන කාර්තුවේදී සියයට 1.4 දක්වා ද අඩු වී ඇතැයි මහ බැංකුවේ නවතම වාර්තාවල දැක්වේ.